දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary: 2784812

කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, **Fax**: 2784846

ඊමේල්/–மெயில்/E-mail : isurupaya@moe.gov.lk

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**கல்வி அமைச்சு**

**Ministry of Education**

"ඉසුරුපාය" , ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
'இசுருபாயா' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No } ......................................

මගේ අංකය / எமது இல. / My No. } ED/1/1/5/7

දිනය / திகதி / Date } 2016. 03. 29

**චක්‍රලේඛ අංකය: 2016 / 08**

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කොට්ඨාස භාර නියෝජ්‍ය/
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම විදුහල්පතිවරුන්

## අධ්‍යාපන අමාත්‍යාංශය සහ ටවර් හෝල් රඟහල පදනම ඒකාබද්ධව පවත්වනු ලබන සමස්ත ලංකා නාට්‍ය තරගය - 2016 (සිංහල මාධ්‍ය)

### 01 හැඳින්වීම සහ අරමුණ :

නාට්‍ය හා රංගකලාව, පාසල් ශිෂ්‍ය ප්‍රජාවගේ නිර්මාණශීලිත්වය පුබුදුවාලන හා ඔවුන්ගේ පෞරුෂ වර්ධනය කෙරෙන මෙවලමක් ලෙස භාවිත කරමින්, පාසලේ පන්ති කාමරයේ කඩඉම් පුළුල් කරමින් නාට්‍ය හා රංගකලා විෂය හා එම විෂයට අදාළ විෂය සමගාමී ක්‍රියාකාරකම් ආශ්‍රයෙන්, දැනුම, ආකල්ප, කුසලතා ප්‍රවර්ධනය කරමින් හා යහපත් පුරුදු වලින් හෙබි නිපුණතා පූර්ණ ශිෂ්‍ය සමාජයක් තුල සමාජයීය එකමුතුව, විනයගරුක බව හා නායකත්වය පිළිබඳව භාවිතයෙන්ම අත්දැකීම් ලබාගැනීමට ඉඩ ප්‍රස්ථා සලස්වමින්, අනාගතයේදී ඔවුන් නිර්මාණශීලී රසඥතාවෙන් පිරිපුන් ප්‍රඥාසම්පන්න, ගුණගරුක පුරවැසියන් ලෙස රටට දායාද කිරීමේ අරමුණින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය හා ටවර් හෝල් රඟහල පදනම ඒකාබද්ධව සමස්ත ලංකා පාසල් නාට්‍ය තරගය නමින් වාර්ෂිකව තරගාවලියක් සංවිධානය කෙරේ.

මෙම තරගාවලියට ඉදිරිපත් කෙරෙන නාට්‍ය නිර්මාණවලදී දරුවන්ගේ ගායන, නර්තන, වාදන හා රංගන හැකියාවන් හා අනෙකුත් ආනුෂංගික අංශයන් සම්බන්ධ අදාළ ක්‍රියාකාරකම් සාමූහිකව සිදුකිරීම තුලින්, ඔවුන්ගේ සැඟවී තිබූ සෞන්දර්යාත්මක නිර්මාණශීලී හැකියාවන් ඔවුන්ට ම හඳුනාගැනීමට සහ එම හැකියාවන් ප්‍රවර්ධනය කිරීමටත් ඉඩ ප්‍රස්ථා සැලසීම සහ එමගින් ඔවුනට පිළිගැනීමක් ලබාදීමද සිදු කෙරේ.

### 02 තරගාවලියේ ස්වභාවය :

මෙම තරගාවලිය තරග අංශ තුනකින් සමන්විතය.

01 නූර්ති ජවනිකා
02 කෙටි නාට්‍ය (ඒකාංක)
03 දිගු නාට්‍ය

#### 2:1 නූර්ති ජවනිකා

1877 දෙසැම්බර් 27 වැනි දින සී. දොන් බස්තියන් ජයවීර බණ්ඩාරයන්ගේ එළොරොලීනා නූර්තිය වේදිකා ගත කරමින් ඇරඹුන නව නාට්‍ය සම්ප්‍රදාය නූර්ති නමින් හැඳින්වුණු අතර, එම නූර්ති ප්‍රදර්ශනය වූ යුගයේ බිහිවුණ නිර්මාණ හා නිර්මාණවේදීන්, පිළිබඳවත් එම නූර්ති

සම්ප්‍රදායේ විශේෂ අනන්‍යතාවක් හිමිකරගත්, උත්තර භාරතීය රාගධාරී සංගීතය පිළිබඳවත්, හැදෑරීමට පෙළඹවීම මෙම නූර්ති ජවනිකා අංශයේ තරග පැවැත්වීම විශේෂ අරමුණක් වේ.

පහතින් දක්වා ඇති නිර්දිෂ්ට කෘතිඅතරින් තොරාගත්, නූර්තියක සංවාද හා ගීත සමග ඇති ජවනිකාවක් හෝ එකම නූර්තියක ගීත හා සංවාද සහිත ජවනිකා කීපයක් අර්ථහානි නොවන ලෙසට ඒකාබද්ධ කරමින් සමස්ත කාලය විනාඩි 25 ත් 30 අතරට සීමාවූන එක් නූර්ති ජවනිකාවක් ලෙස ඉදිරිපත් කිරීම මෙයින් අපේක්ෂා කෙරේ.

**නිර්දිෂ්ට කෘති**

- **නීතිඥ ජෝන් ද සිල්වා සූරීන්ගේ වෙස්සන්තර/ ශ්‍රී වික්‍රම/ සිරිසඟබෝ**
- **නීතිඥ චාල්ස් ඩයස් සූරීන්ගේ විධුර/ පද්මාවතී**

නිර්දිෂ්ට කෘති වලට අදාළ මුද්‍රිත නූර්ති පිටපත් හා ඒ ඒ නූර්ති වලට අදාළ සම්පූර්ණ ගීත ඇතුළත් සංයුක්ත තැටි ඉතා පහසු මිළට ටවර් පොත්හල වෙතින් ලබාගත හැක.

<u>නූර්ති අංශයේ අයදුම්කරුවන්ට අයදුම්පත් ඉදිරිපත් කිරීමත් සමග පුහුණුවීම් ආරම්භ කළ හැක.</u>

**2:2 කෙටි නාට්‍ය අංශය (ඒකාංක)**

දරුවන්ගේ පෞරුෂ වර්ධනයට ඉවහල් වන්නා වූ නිර්මාණශීලී අපූර්වතාවක් ප්‍රකට කෙරෙන, ළමා මනසට උචිත වන්නාවූ එහෙත් ළමා නාට්‍ය නොවන ස්වීය පිටපතකින් නිර්මාණය කෙරුන එක් අංකයකින් යුත් විනාඩි 25 - 30 ත් අතර කාලයක් ප්‍රදර්ශණය කෙරෙන නාට්‍යයක් ඉදිරිපත් කිරීම මෙහිදී අපේක්ෂා කෙරේ.

**2:3 දිගු නාට්‍ය**

දරුවන්ගේ පෞරුෂ වර්ධනයට ඉවහල් වන්නාවූ නිර්මාණශීලී අපූර්වත්වයක් ප්‍රකට කෙරෙන, ළමා මනසට උචිත වන්නාවූ, එහෙත් ළමා නාට්‍ය නොවන, ස්වීය වූ පිටපතක් ඇසුරෙන් නිර්මාණය කෙරුනු එක් අංකයකින් හෝ අංක කීපයකින් සමන්විත, විනාඩි 60 - 90 ත් අතර කාලයක් තුල ප්‍රදර්ශනය කෙරෙන නාට්‍ය නිර්මාණ ඉදිරිපත් කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ.

## 03. තරග පැවැත්වෙන ආකාරය:

මෙම තරගය පහත සඳහන් අදියර මගින් ක්‍රියාත්මක වනු ඇත.

**3:1** I **අදියර - අයදුම්පත් කැඳවීම**

පළාත් සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් අදාළ චක්‍රලේඛ හා අයදුම්පත් බෙදාහැරෙන අතර, එමගින් සහ ටවර් හෝල් රඟහල පදනම වෙතින් හෝ ටවර් හෝල් රඟහල පදනම නිල වෙබ් අඩවිය (www.towerhall.lk) වෙතින් හෝ අධ්‍යාපන අමාත්‍යාංශයේ (www.moe.gov.lk) නිල වෙබ් අඩවිය වෙතින් හෝ අයදුම්පත් ලබාගත හැකි වේ. (නාට්‍ය අධ්‍යක්ෂ ගුරුභවතෙක්ම විය යුතු බැවින්, අයදුම් කළ යුත්තේද ගුරුභවතෙකු විසින්ම පමණක් විය යුතුය)

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත විදුහල්පති නිර්දේශය හා අනුමැතිය සහිතව 2016 **අප්‍රේල්** 29 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට තැපැල් කළ යුතු අතර එහි පිටපතක් තම පළාතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද යැවිය යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්, ටවර් හෝල් රඟහල පදනම, 'සව්සිරිපාය' අංක 123, විජේරාම මාවත, කොළඹ 07.**

**3:2** II **අදියර - පිටපත් රචනය සම්මන්ත්‍රණය**

කෙටි හා දිගු නාට්‍ය සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන්ට නාට්‍ය රචනය පිළිබඳ එක්දින සම්මන්ත්‍රණයක් මාර්තු/ අප්‍රේල් මාසයකදී කොළඹ දී පැවැත්වෙන අතර, තම පිටපත් සකස් කරගැනීමට එමගින් ඔවුන්ට අවස්ථාව උදාවේ.

**3:3** III **අදියර - පිටපත් රචනය**

A 4 ප්‍රමාණයේ කඩදාසි වල තනිපැත්තේ යතුරු ලියනය හෝ පරිගණක භාවිතයෙන් (Type Setting) විධිමත් ලෙස සකස් කරන ලද තමාගේම රචනයක් ලෙසට සහතික කර විදුහල්පති මගින් තම පිටපත, ඉහත II අදියරෙහි සඳහන් සම්මන්ත්‍රණයෙන් පසු සති දෙකක් ඇතුළත ඉහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය.

එ. ප. සි. කුමාර ගුණසිංහ
අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය)

### 3:4 IV අදියර - ප්‍රථම වටය

නිෂ්පාදනය කෙරුනු නාට්‍ය හෝ නූර්ති ජවනිකා විනිශ්චය මණ්ඩලය විසින් ඒ ඒ පාසල් වෙත පැමිණ නරඹා අවසන් වටයට සුදුසු නාට්‍ය හෝ නූර්ති ජවනිකා තෝරාගැනීම 2016 සැප්තැම්බර් දෙවන සතියේ සිට නොවැම්බර් දෙවන සතිය ඇතුළත කාලයකදී සිදුකරනු ලබන අතර, මෙම තරග විනිශ්චය විෂය ප්‍රාමාණිකයන්ගෙන් සැදුම්ලත් විනිශ්චය මණ්ඩලයක් විසින් සිදු කෙරේ.

මෙම අදියර අවසන් වටයට සුදුසු නාට්‍ය හෝ නූර්ති ජවනිකා තෝරාගැනීමේ අදියර වන බැවින්, හැකිතාක් දුරට පරිපූර්ණ නිර්මාණයක් ඉදිරිපත් කිරීම අපේක්ෂා කෙරෙන අතර, තම නාට්‍ය කුමන හේතුවක් මත මෙම අදියරේදී තරගාවලියට ඉදිරිපත් කිරීමට නොහැකි නම් ඒ බව ප්‍රදර්ශනයට නියමිත දිනට අවම වශයෙන් දින 07 කට පෙර ලිඛිතව දැන්විය යුතුය.

### 3:5 V අදියර - නාට්‍ය නිෂ්පාදන නේවාසික වැඩමුළුව

අවසාන වටයට තෝරා ගන්නා නාට්‍ය වල අධ්‍යක්ෂවරුන් හා ඒ ඒ නාට්‍යයේ තවත් එක් ආනුෂාංගික අංශ ශිල්පියෙක් සඳහා තෙදින නේවාසික වැඩමුළුවක් ක්‍රියාත්මක කෙරේ.

### 3:6 VI අදියර - අවසාන වටය

ඒ ඒ අංශ වලින් වඩා වැඩි නිර්මාණශීලී අපූර්වත්වයක් ප්‍රකට කරන ලදුව, අවසන් වටයට තෝරාගත් සියළු නාට්‍ය 2017 ජනවාරි කොළඹ ප්‍රධාන රඟහලක ජාතික මට්ටමින් එක දිගට පැවැත්වෙන උළෙලකදී වේදිකාගත කෙරෙන අතර, මෙහිදී විෂය ප්‍රාමාණික විද්වතුන්ගෙන් සැදුම්ලත් විනිශ්චය මණ්ඩලයකින්, එම නාට්‍ය විනිශ්චය කර සම්මාන පුදකර අගය කළ යුතු නාට්‍ය නිර්මාණ හා සම්මානලාභීන් නිර්දේශ කිරීම සිදුකෙරේ.

### 3:7 VII අදියර - තිළිණ හා සම්මාන ප්‍රදානෝත්සවය

සමස්ත ලංකා පාසල් නාට්‍ය තරගයේ ජයග්‍රහණ ලැබූවන්ට තිළිණ, සම්මාන හා සහතික ප්‍රදානය කෙරෙන සම්මාන උළෙල 2017 පෙබරවාරි/ මාර්තු මාසයකදී ජාතික මට්ටමෙන් ටවර් හෝල් රඟහල පදනමේ ගරු සභාපති ගරු අග්‍රාමාත්‍යතුමා, අධ්‍යාපන අමාත්‍යතුමා, සම්මානනීය කලාකරුවන් ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසකගේ සහභාගීත්වයෙන් අගනුවරදී පැවැත්වේ.

## 04 පොදු කොන්දේසි :

4:1 මේ සමඟ අමුණා ඇති අයදුම්පත්‍රයේ ඡායා පිටපත් යොදා ගනිමින්, එක් පාසලකට තරග අංශ තුනම සඳහා ඉදිරිපත් විය හැකි අතර, එක් පාසලකින් එක් අංශයක් සඳහා ඉදිරිපත් කළ හැක්කේ එක් නාට්‍ය නිර්මාණයක් පමණි.

4:2 සෑම නිර්මාණයකටම දායක කරගත හැකි අවම ශිෂ්‍ය ප්‍රමාණය වේදිකාව මත සංවාද භාවිතා කරමින් රඟන තිදෙනෙකුගෙන් (ආනුෂංගික ශිල්පීන් හැර) සමන්විත විය යුතු අතර උපරිමය 40 ක් (ආනුෂාංගික ශිල්පීන් ද සමඟ) නොඉක්මවිය යුතුය.

4:3 අයදුම්කරුවෙකු කවර හෝ හේතුවක් මත වෙනත් පාසලකට මාරුවී ඇත්නම්, පාසල් දෙකෙහිම විදුහල්පතිවරුන්ගේ එකඟතාව මත අයදුම්කරු කැමති පාසලකින් තම නාට්‍ය නිර්මාණය ඉදිරිපත් කළ හැකි අතර, ඒ පිළිබඳව විදුහල්පතිවරුන් දෙදෙනාගේම එකඟතාවන් ලිඛිතව අදාළ විදුහල්පතිවරුන් මගින් ටවර් හෝල් රඟහල පදනමේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා එවිය යුතුය.

4:4 වෙනත් නාට්‍ය තරගයකට තමා ඉදිරිපත් කළ කිසිදු නාට්‍ය පිටපතක් මෙම තරගයට ඉදිරිපත් නොකළ යුතු අතර, අනුන්ගේ පිටපත් හෝ විකෘති කරන ලද නාට්‍ය පිටපතක් හෝ වංචනික ලෙස ඉදිරිපත් කර ඇති විටෙක ඒ සම්බන්ධයෙන් අදාළ බලධාරීන්ට දන්වා තරගයෙන් ඉවත් කිරීමට කටයුතු කරන බැවින්, එවැනි ක්‍රියාවන්ගෙන් සම්පූර්ණයෙන්ම වැළකී සිටිය යුතුය.

4:5 මෙම තරගාවලියේ අවසන් වටය නිමවනතුරු වෙනත් කුමන හෝ තරගයකට මෙම පිටපත හෝ නිෂ්පාදනය ඉදිරිපත් කිරීම සපුරා තහනම් වේ.

4:6 තම නූර්ති ජවනිකාවේ/ කෙටි හෝ දිගු නාට්‍යයේ රංගනය සඳහා තම පාසලේ සිසු සිසුවියන් පමණක් යොදා ගැනීමට අයදුම්කරු කටයුතු කළ යුතු අතර, අනෙක් ආනුෂාංගික ක්‍රියාකාරකම් සඳහා තම පළාතේ වෙනත් පාසලක ගුරුවරුන් සහ සිසුන් පාසල් දෙකෙහිම විදුහල්පතිවරුන්ගේ ලිඛිත අවසරය මත පමණක් යොදාගත හැක. තවද කෙටි හා දිගු නාට්‍ය සඳහා අධ්‍යක්ෂණය ගුරු භවතෙකු විසින්ම සිදුකළ යුතු අතර, රචනය ඇතුළු සෙසු අංශ සඳහා ශිෂ්‍යයන්ට ඉදිරිපත් විය හැකිය.

4:7 සෑම නූර්ති ජවනිකාවක්/ නාට්‍යයක් ම නියමිත දින, නියමිත වේලාවට ප්‍රදර්ශනය කිරීම නාට්‍ය අධ්‍යක්ෂණය කළ ගුරුභවතාගේ වගකීම වන අතර, එසේ ප්‍රදර්ශනය කිරීමට අපොහොසත් වුවහොත් ස්ව කැමැත්තෙන් තම නූර්ති ජවනිකාව/ නාට්‍ය මෙම තරගයෙන් ඉවත් කරගත්තා ලෙස සළකා ඉදිරියට කටයුතු කරනු ඇත.

4:8 තිළිණ හා සම්මාන ප්‍රදානෝත්සවය සඳහා සහභාගී වන සිසුන් පාසල් නිල ඇඳුමින් සහ ගුරුභවතුන් උත්සවයේ ගෞරවය රැකෙන පරිදි සුදුසු ඇඳුමකින් සැරසී පැමිණීම අනිවාර්ය වේ.

4:9 තරග සංවිධානය, විනිශ්චය මණ්ඩල පත්කිරීම හා විනිශ්චයන් පිළිබඳ මතුවන්නාවූ ගැටළු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම, තරගයේ කොන්දේසි උල්ලංඝනය කිරීම සම්බන්ධව හෝ තරග සංවිධාන කටයුතු පිළිබඳ සියළු තීරණ ගැනීමේ වගකීම ටවර් හෝල් රඟහල පදනම සතු බව අයදුම්කරුවන් අවිවාදයෙන් පිළිගත යුතුය.

4:10 මෙම තරගාවලියේ විනිශ්චයන් සිදුකරන විනිශ්චය මණ්ඩලයන්හි තීරණයන් අවසානාත්මක හා තීරණාත්මක වේ.

## 05 තිළිණ හා සම්මාන ප්‍රදානය :

5:1 සමස්ත ලංකා පාසල් නාට්‍ය තරගයේ ජයග්‍රාහකයින් සඳහා පහත සඳහන් පරිදි තිළිණ හා සම්මාන පිරිනැමේ.

| තරග අවස්ථාව | නූර්ති ජවනිකා | කෙටි නාට්‍ය (ඒකාංක) | දිගු නාට්‍ය |
|---|---|---|---|
| හොඳම සංගීත අධ්‍යක්ෂණය | රු: 10,000/- | රු: 5,000/- | රු: 7,500/- |
| හොඳම වේදිකා පසුතල නිමැවුම | රු: 10,000/- | රු: 5,000/- | රු: 7,500/- |
| හොඳම රංග වස්ත්‍ර නිර්මාණය | රු: 10,000/- | රු: 5,000/- | රු: 7,500/- |
| හොඳම අංග රචනය | රු: 10,000/- | රු: 5,000/- | රු: 7,500/- |
| හොඳම සහාය රංගනය (නිළි) | රු: 10,000/- | රු: 10,000/- | රු: 10,000/- |
| හොඳම සහාය රංගනය (නළු) | රු: 10,000/- | රු: 10,000/- | රු: 10,000/- |
| හොඳම රංගනය (නිළි) | රු: 15,000/- | රු: 15,000/- | රු: 15,000/- |
| හොඳම රංගනය (නළු) | රු: 15,000/- | රු: 15,000/- | රු: 15,000/- |
| හොඳම පිටපත 3 ස්ථානය | - | රු: 7,500/- | රු: 15,000/- |
| හොඳම පිටපත 2 ස්ථානය | - | රු: 10,000/- | රු: 20,000/- |
| වසරේ හොඳම පිටපත | - | රු: 15,000/- | රු: 25,000/- |
| වසරේ හොඳම අධ්‍යක්ෂණය | රු: 20,000/- | රු: 15,000/- | රු: 25,000/- |
| හොඳම නිෂ්පාදනය 3 ස්ථානය | රු: 20,000/- | රු: 15,000/- | රු: 20,000/- |
| හොඳම නිෂ්පාදනය 2 ස්ථානය | රු: 25,000/- | රු: 20,000/- | රු: 25,000/- |
| වසරේ හොඳම නිෂ්පාදනය | රු: 30,000/- | රු: 25,000/- | රු: 30,000/- |

5:2 අවසාන වටය නියෝජනය කරන සෑම නූර්ති ජවනිකා හෝ නාට්‍යයන්හි, නාට්‍ය අධ්‍යක්ෂණය කරන ගුරුභවතුන් සඳහා සහභාගීත්වය වෙනුවෙන් රු: 5,000/ ක මුදල් තිළිණයක් ප්‍රදානය කෙරේ.

5:3 විශේෂ කුසලතා ප්‍රකට කරන අය සඳහා විශිෂ්ට කුසලතා ඇගයීමක් හෝ කුසලතා සහතික ප්‍රදානය කෙරේ.

5:4 අවසාන වටය නියෝජනය කරන නාට්‍ය වල සියලුම සිසු සිසුවියන් හා ගුරුභවතුන්ට සහභාගීත්වය වෙනුවෙන් සහතික පත් ප්‍රදානය කෙරේ.

අධ්‍යාපන අමාත්‍යාංශය හා ටවර් හෝල් රඟහල පදනම ඒකාබද්ධව පවත්වන මෙම තරගාවලිය සාර්ථක කර ගැනීමට ඔබ දක්වනු ලබන සහයෝගය අතිශයින් ම අගයමි.

ඩබ්ලිව්. එම්. බන්දුසේන
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

ව. ප. නි. තුෂාර ගුණතිලක
අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය)
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය - බත්තරමුල්ල

අධ්‍යාපන අමාත්‍යාංශය
සහ
ටවර් හෝල් රඟහල පදනම

## සමස්ත ලංකා නාට්‍ය තරගය - 2016 (සිංහල මාධ්‍ය)

# අයදුම් පත්‍රය

තරග අංශය :..........................................................................................................

නාට්‍යයේ නම :..........................................................................................................

පාසලේ නම :..........................................................................................................

පළාත :.................................................... දිස්ත්‍රික්කය ....................................................

01 අයදුම්කරුගේ නම :..................................................................................මයා/ මිය

ජාතික හැඳුනුම් පත් අංකය : ..............................................................

ලිපිනය : ..........................................................................................................

..........................................................................................

දුරකථන අංකය : නිවස ..............................................

ජංගම ..............................................

02 පිටපත් රචකයාගේ නම :.................................................................... මයා/ මිය

ජාතික හැඳුනුම් පත් අංකය : ..............................................................

ලිපිනය : ..........................................................................................................

..........................................................................................

දුරකථන අංකය : නිවස ..............................................

ජංගම ..............................................

03 අධ්‍යක්ෂවරයාගේ නම :.................................................................... මයා/ මිය

ජාතික හැඳුනුම් පත් අංකය : ..............................................................

ලිපිනය : ..........................................................................................................

..........................................................................................

දුරකථන අංකය : නිවස ..............................................

ජංගම ..............................................

04 සංගීත අධ්‍යක්ෂවරයාගේ නම :.................................................................... මයා/ මිය

ජාතික හැඳුනුම් පත් අංකය : ..............................................................

ව. ප. නි. තුෂාර ගුණතිලක
අධ්‍යාපන අධ්‍යක්ෂ
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය

ලිපිනය : ..........................................................................................................

..............................................................................................

දුරකථන අංකය : නිවස ................................................

ජංගම ................................................

05 පාසලේ ලිපිනය: ................................................................................................

................................................................................................

දුරකථන අංකය : ..............................................................................

06 කලාප අධ්‍යාපන කාර්යාලය හා ලිපිනය : ........................................................

..............................................................................

දුරකථන අංක : ..............................................................................

07 පාසලේ සිට ආසන්නතම ප්‍රධාන නගරය: ..............................................................

08 ප්‍රධාන නගරයේ සිට පාසලට දුර : ..............................................................

(කරුණාකර මාර්ග සටහනක් ඇඳ අයදුම්පතට අමුණන්න)

ඉහතින් දක්වා ඇති තොරතුරු මාගේ දැනුමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බවත් මෙම තරගාවලියට අදාළ කොන්දේසි වලට අනුකූලව මෙම නාට්‍ය නිර්මාණය ඉදිරිපත් කරනු ලබන බවත්, මෙම පිටපත වෙනත් කවර හෝ අයෙකු විසින් මීට පෙර රචනා කරන ලද්දක් හෝ අධ්‍යක්ෂණය කරන ලද්දක් හෝ ශ්‍රී ලංකාවේ කුමන හෝ නාට්‍ය තරගයකට කුමන මට්ටමකින් හෝ ඉදිරිපත් කළ නාට්‍යයක් නොවන බව ස්ථිර කර ප්‍රකාශ කර සිටින අතර, ඉහත සඳහන් කරන ලද කුමන හෝ කරුණක් අසත්‍ය යැයි මෙම නාට්‍ය තරගාවලියේ කුමන හෝ අවස්ථාවක හෙළිදරව් වුවහොත්, ඉහත කී නාට්‍යය මෙම තරගාවලියෙන් ඉවත් කිරීමට ටවර් හෝල් රඟහල පදනමට ඇති අයිතිය පිළිගන්නා බවත්, මෙම නාට්‍ය තරගාවලියේ දී විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය ලෙස අවිවාදයෙන් පිළිගන්නා බවත්, මෙම නාට්‍යයට සම්බන්ධ සියළුම ශිල්පීන් අදාළ කොන්දේසි අනුව තෝරාගත් අය බවත්, මෙම නිර්මාණය සඳහා රංගනයෙන් දායකවන සියළුදෙනාම මෙම පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් බවත් සහතික කර ප්‍රකාශ කර සිටිමි.

..................................... ..............................................

දිනය අයදුම්කරුගේ අත්සන

ඉහත සඳහන් චක්‍රලේඛයේ සඳහන් කොන්දේසි වලට අනුකූලව මෙම නාට්‍ය, නිර්මාණය කර ඇති බවත්, මෙම නිර්මාණයේ රංගනය සඳහා දායක වන සියළුම සිසු සිසුවියන් මෙම පාසලේ ඉගෙනුම ලබන අය බවත්, ඉහත අයදුම්කරු/ කාරිය, නාට්‍යයේ අධ්‍යක්ෂක මෙම පාසලේ ගුරු මණ්ඩලයේ අයෙකු බවත්, අයදුම්පත මාගේ පූර්ණ අනුමැතිය මත ඉදිරිපත් කරන බවත්, නාට්‍ය නිර්මාණය කර ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය හා අනුග්‍රහය ලබාදෙන බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

............................ .............................................. ..................................................

දිනය විදුහල්පතිගේ/ විදුහල්පතිනියගේ නම විදුහල්පතිගේ/විදුහල්පතිනියගේ අත්සන

නිල මුද්‍රව

ව. ප. නි. තුෂාර ගුණතිලක
අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය)
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය - බත්තරමුල්ල